# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2071/5 – 2018 මැයි 14 වැනි සඳුදා – 2018.05.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිගම් කෝරළේ සුළු කොට්ඨාසයේ, කටුවන්ගොඩ ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/එම්එල්එම්/2017/132 සහ 2017.04.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – හෙට්ටිගේවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0847 ක් පමණ**

උතුරට: මාර්ගය, ඩී. ජී. රූපිකා දමයන්ති හිමිකම් කියන හෙට්ටිගේවත්ත සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); නැගෙනහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ ඉඳුනිල් මලවිආරච්චි හිමිකම් කියන හෙට්ටිගේවත්ත; දකුණට: ඉඳුනිල් මලවිආරච්චි හිමිකම් කියන හෙට්ටිගේවත්ත; බටහිරට: මාර්ගය, ඩී. ජී. රූපිකා දමයන්ති හිමිකම් කියන හෙට්ටිගේවත්ත.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2016/ඩබ්ලිව්එස්/518.
2018 පෙබරවාරි මස 14 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 - 23